ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන - 2024/2025
අවසාන පරීක්ෂණය - 2025
SNP8340/SNP8530- විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සඳහා මනෝවිද්‍යාව
කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2025.07.19 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්න වලටද 2 වන කොටසින් ඕනෑම ප්‍රශ්න තුනකටද (3) පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

1. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ගුරුවරයෙකුට ඔහුගේ/ඇයගේ වෘත්තීය දියුණුව සඳහා අධ්‍යාපන මනෝවිද්‍යාවේ වැදගත්කම් පහක් (05) සඳහන් කරන්න.

2. සංවර්ධන මනෝවිද්‍යාඥයින් විසින් අනුගමනය කරන ලද ළමා සංවර්ධනයේ ප්‍රධාන අවධීන් කෙටියෙන් පැහැදිලි කරන්න.

3. ළමා අධ්‍යයන ක්‍රමයක් ලෙස සම්මුඛ පරීක්ෂණ ක්‍රමයේ ශක්තීන් දෙකක් (02) සහ දුර්වලතා දෙකක් (02) සඳහන් කරන්න.

4. "තීරණාත්මක අවධීන්" (Critical stages) පිළිබඳ සංකල්පය විශේෂ අධ්‍යාපන ඒකකයක ගුරුවරයෙකුට වැදගත් වන්නේ කෙසේදැයි උදාහරණ දෙකක් (02) දක්වමින් කෙටියෙන් පැහැදිලි කරන්න.

5. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන්ගේ මතකය වැඩි දියුණු කිරීමට භාවිත කළ හැකි ක්‍රම පහක් (05) ලැයිස්තුගත කරන්න.

6. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන්ට ඵලදායී ඉගෙනුම් අත්දැකීම් ලබා දීම සඳහා චර්යාත්මක ඉගෙනුම් න්‍යායන්හි (Behavioral Learning Theories ) න්‍යායික අදහස් ඔබ යොදා ගන්නේ කෙසේදැයි කෙටියෙන් විස්තර කරන්න.

7. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන්ගේ පෞරුෂය සංවර්ධනයට බලපාන සාධක තුනක් (03) පැහැදිලි කරන්න.

8. අන්තර්කරණ පන්ති කාමරයක් තුළ සිටින විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන්ගේ චිත්තවේගීය සංවර්ධනයට ඔබ පහසුකම් සලසන්නේ කෙසේදැයි කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 05x08 = ලකුණු 40)

## 2 වන කොටස

9. (i) විශේෂ අවශ්‍යතා අධ්‍යාපන ක්ෂේත්‍රයේ අධ්‍යාපනඥයෙකුට ඉගෙනුම් න්‍යායන් (learning theories) අධ්‍යයනය කිරීමේ වැදගත්කම හේතු දෙකක් (02) දක්වමින් කෙටියෙන් පැහැදිලි කරන්න.(ලකුණු 04)

   (ii) එක් ඉගෙනුම් න්‍යායයක් තෝරා ගෙන, එහි මූලික මූලධර්ම විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන්ගේ ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රියාවලියට යොදා ගත හැක්කේ කෙසේදැයි විමර්ශනය කරන්න.(ලකුණු 06)

   (iii) එම මූලධර්ම ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රියාවලියට යෙදීමේදී ඔබට මුහුණ දීමට සිදු විය හැකි අභියෝග තුනක් (03) විස්තර කර, එම අභියෝග ජය ගැනීමට යෝජනා තුනක් (03) ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

10. (i) පර්යේෂණාත්මක ළමා අධ්‍යයන ක්‍රම (experimental child study methods) සහ පර්යේෂණාත්මක නොවන ළමා අධ්‍යයන ක්‍රම (non-experimental child study methods) අතර වෙනස්කම් තුනක් (03) පැහැදිලි කරන්න. (ලකුණු 04)

   (ii) ප්‍රාථමික ශ්‍රේණියක සිටින චර්යාත්මක ගැටලු ඇති දරුවෙකු පරීක්ෂා කිරීම සඳහා සුදුසු ළමා අධ්‍යයන ක්‍රමයක් තෝරාගෙන, එම ක්‍රමය තෝරා ගැනීමට හේතු දක්වන්න. (ලකුණු 06)

   (iii) තෝරාගත් ළමා අධ්‍යයන ක්‍රමය භාවිතයෙන් විශ්වාසනීය සහ වලංගු දත්ත රැස් කිරීමට ඔබ යොදා ගන්නා ක්‍රියා පටිපාටිය සාකච්ඡා කරන්න. (ලකුණු 10)

11. (i) "සමබර පෞරුෂය" (Balanced Personality) යන පදය පැහැදිලි කරන්න. (ලකුණු 04)

   (ii) ෆොයිඩ්ගේ මනෝවිශ්ලේෂණ න්‍යායේ (Freud's psychoanalytic theory) මූලික මූලධර්ම අනුව පුද්ගලයෙකුගේ පෞරුෂය සංවර්ධනය වන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 06)

   (iii) ඉහත සඳහන් මූලික මූලධර්ම විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන්ගේ පෞරුෂය සංවර්ධනයට පහසුකම් සැලසීම සඳහා ගුරුවරයෙකුට භාවිත කළ හැකි ආකාරය, උදාහරණ තුනක් (03) දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10)

12. (i) "විශේෂ අධ්‍යාපන තක්සේරුව" (Assessment in special education) යන සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 04)

   (ii) විශේෂ අධ්‍යාපනයේදී භාවිත කරන විකල්ප තක්සේරුකරණ ක්‍රම (alternative assessment methods) තුනක් (03) විස්තර කරන්න. (ලකුණු 06)

   (iii) මධ්‍යස්ථ ඔටිසම් පරාසයික අක්‍රමතාව (Moderate Autism Spectrum Disorder- ASD) සහිත දරුවෙකු සඳහා විකල්ප තක්සේරුකරණ ක්‍රමයක් පැහැදිලි කර, එම ක්‍රමය දරුවාගේ ඉගෙනුම් අවශ්‍යතා සහ චර්යාත්මක ලක්ෂණ සඳහා ආමන්ත්‍රණය කරන්නේ කෙසේදැයි විමර්ශනය කරන්න. (ලකුණු 10)

13. (i) Gagne ගේ තොරතුරු සැකසුම් ආකෘතියේ (Gagne's information Processing Model) ප්‍රධාන අංග පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) ඉගැන්වීම් සහ ඉගෙනුම් ක්‍රියාවලියේදී විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන්ගේ අවධානය ලබා ගැනීමට ඔබ භාවිත කරන උපාය මාර්ග තුනක් (03) විස්තර කරන්න. (ලකුණු 06)

(iii) Schunk (2012) ට අනුව, "ඉගෙන ගැනීම යනු ප්‍රායෝගික හෝ විවිධ ආකාරයේ අත්දැකීම්වල ප්‍රතිඵලයක් ලෙස ඇති වන චර්යාවේ කල් පවතින වෙනස්කමකි." මෙම ප්‍රකාශය හේතු තුනක් (03) දක්වමින් සාධාරණීකරණය කරන්න. (ලකුණු 10)

14. (i) පිළිගත් අර්ථ දැක්වීමක් දක්වමින්, "ගෝලීය වර්ධන ප්‍රමාදය" (Global Developmental Delay- GDD) යන පදය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන්ගේ ඉගෙනීමට ගෝලීය වර්ධන ප්‍රමාදය බලපාන්නේ කෙසේදැයි උදාහරණ තුනක් (03) දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(iii) ලෙව් විගොට්ස්කිගේ ප්‍රජානන සංවර්ධන න්‍යායේ (Lev Vygotsky's theory of cognitive development) මූලධර්ම ගෝලීය වර්ධන ප්‍රමාදය සහිත දරුවන්ගේ ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රියාවලියට ඔබට යෙදිය හැකි ආකාරය, උදාහරණ තුනක් (03) සපයමින් යෝජනා කරන්න. (ලකුණු 10)

*-සියලුම හිමිකම් ඇවිරිණි.-*